<u>අනේ කුරුලු කූඩු</u>

අනේ කුරුලු කූඩුවලට
ගහන්නෙපා කැට කැබිලිති
දුකින් හැදූ කුරුලු කූඩුවේ
අපි ඉන්නම් අපේ පාඩුවේ

අනුන් හැදූ කූඩු කඩා
පව් පුරවා ගන්න එපා
දීග ගෙනා කුරුල්ලෙකුගෙ
හිත කළඹාලන්න එපා

කුරුලු රජෙක් සොයාගන්න
ඉගිලී යන රෑන මැදින්
වෙනින් ගෙයක් හදා ගන්න
සවිමත් අතු ඉති අතරින්

සංගීත නිර්මාණය: ආචාර්ය වික්ටර් රත්නායක
ගායනය : අබේවර්ධන බාලසූරිය